**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2013**
**------------------------------------------**

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**02.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.**1** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව පැවැත්ම තහවුරු නොවූ රු. 323,664 ක් වටිනා භාණ්ඩ වර්ග 108 ක වටිනාකම සහ බාහිර පාඨමාලා දෙකක් සඳහා ප්‍රධාන ශාඛාවෙන් නිකුත් කර තිබුණු රු. 252,542 ක් වටිනා ද්‍රව්‍යවල වටිනාකම වශයෙන් එකතුව වූ රු. 576,206 ක් සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ ව්‍යාපෘති සහ බාහිර පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණු වියදම්වල එකතුව වූ රු. 598,719 ක් විශ්වවිද්‍යාලයට ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 95,864,363 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 10 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය වෙත බාහිර පාර්ශවයක් විසින් ලබාදී තිබුණු රු.1,000,000 ක මුදල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම මත 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළිය වූ රු.130,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

2.2.**2** පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව වර්ෂයේ ක්ෂය කිරීම් රු. 120,963,189 ක් වූ අතර, ඊට අදාල උපලේඛණය අනුව එම වටිනාකම රු. 119,689,250 ක් වූයෙන් ඒ අතර රු. 1,273,949 ක වෙනසක් අනාවරණය විය. තවද ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ස්ථාවර වත්කම්වලට එකතු කිරීම් රු.100,561,348 ක් ලෙස වාර්තා කර තිබුණද ඊට අදාල උපලේඛණය අනුව එම වටිනාකමරු. 99,**2**87,399 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 1,273,94**9** ක වෙනසක් අනාවරණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 1996 සිට 2012 වර්ෂය දක්වා කාලය තුළ පුස්තකාල පොත් සහ සඟරා මිලදී ගැනීම සඳහා ලබා දෙන ලද රු. 929,684 ක අත්තිකාරම්ද, 2011 වර්ෂයේදී ලබාදී තිබූ රු. 3,136,709 ක කොන්ත්‍රාත් අත්තිකාරම්ද, වර්ෂ 02 සිට වර්ෂ 08 දක්වා කාලයකට පෙර ලබාදී තිබූ රු.340,206 ක සේවා අත්තිකාරම්ද, නිලධාරීන් 12 දෙනෙකු වෙත 2009 වර්ෂයට පෙර ලබාදී තිබූ රු.200,551 ක අත්තිකාරම් මුදල්ද වශයෙන් එකතුව වූ රු.4,607,150 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට පරිශේෂව පැවති  රු. 74,545 ක ණයගැති ශේෂයන් හා රු. 16,187 ක ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවා ගෙන නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට පැවති රු.25,992,699 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන රු.3,123,018 ක්ද විය.

2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන  සංග්‍රහය 3 පරිච්ඡේදයේ 24.8 වගන්තිය | තාවකාලික ආචාර්යවරුන්ගේ සම්පූර්ණ සේවා කාලය වර්ෂ 02 කට නොවැඩි විය යුතු වුවද, එයට පටහැනිව තාවකාලික කථිකාචාර්යවරුන් 128 දෙනෙකු වෙත වර්ෂ 02 ක් ඉක්මවා පත්වීම් ලබාදී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 271 (2) (අ) (ආ) | 1995 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා නොගෙවන ලද රු. 342,766 ක් වටිනා වැටුප් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ) | අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000 ක් වුවද, එම සීමාව ඉක්මවා අවස්ථා 09 කදී රු.567,050 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඇ) | වටිනාකම රු. 358,180 ක් වූ නිකුත් කරන ලද දින සිට මාස 06 ක කාලයක් ඉක්ම වූ ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් 47 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iv) මුදල් රෙගුලාසි 571 (2) | තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක් ඉක්ම වූ රු. 1,308,558 ක් වටිනා විවිධ තැන්පතු 110ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය භාවිතා කල වාහන 06 ක් වෙනුවෙන් නිකුත් කළ රු.604,866 ක් වටිනා ඉන්ධන වියදම් සනාථ කිරීම සඳහා අවශ්‍ය දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ රෙගුලාසි ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.13 ඡේදය | යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගෙන් වාර්තා ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 09 කදී වාහන අළුත්වැඩියාව සඳහා රු. 691,665 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා අත්පොත | |
| (i) 3.5 හා 9.3 මාර්ගෝපදේශ සහ ප්‍රසම්පාදන අත්පොතෙහි 2.14.1 ඡේදය හා මුදල් රෙගුලාසි 135 | අවස්ථා 02 කදී රු. 439,065 ක වාහන අලුත්වැඩියා වියදම් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් හා මුදල් රෙගුලාසි 135 යටතේ වූ විශ්වවිද්‍යාලයේ බලය පැවරීම පිළිබඳව සීමාවන් උල්ලංඝණය කර තිබුණි. |
| (ii) ප්‍රසම්පාදන අත්පොතෙහි 8.13.4 ඡේදය හා 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ව්‍යවහාරික විද්‍යා පීය ගොඩනැගිල්ල Stage II, Phase II ඉදිකිරීමේදී කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 13.78 ක් දක්වා වූ විචලනයන් වෙනුවෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්දේශය මත පමණක් රු.3,786,021 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛය | නව වාහන මිලදී ගැනීමෙන් පසුව කුළී වාහන ඉවත් කළ යුතු වුවද, වයඹ විශ්වවිද්‍යාලය විසින් නව වාහන පහක් මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී කුළී වාහන වෙනුවෙන් රු.1,821,666 ක් ගෙවා තිබුණි. |
| (ඊ) මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 මාර්තු 10 දිනැති කළමනාකරණ සේවා | සමාලෝචිත වර්ෂයේදී කථිකාචාර්යවරුන් 11 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා වශයෙන් රු.1,502,392 ක් ගෙවා තිබූ අතර, එම වසර තුළ කරන ලද අවසාන පර්යේෂණ වාර්තාව හා වසර 02 ක් අවසානයේ ප්‍රසිද්ධ කළ යුතු වාර්තාව අදාල |

| | |
|---|---|
| චක්‍රලේඛ අංක 44 (03)(ආ) ඡේදය | පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීමෙන් තොරව ඔවුන් වෙත සමාලෝචිත වර්ෂය ඉක්මවාද අදාල දීමනාව අඛණ්ඩව ගෙවා තිබුණි. |

**03.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 135,853,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.125,112,000 ක ඌනතාවයක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,741,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්යසාධනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(i).** සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය විසින් උපයාගත් ආදායම් සියයට 29 කින් වර්ධනය වී තිබුණද, එහි ඇතුළත් ආයෝජන ආදායම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී රු. 186,000 කින් අඩුවී තිබූ අතර, එහි ප්‍රතිශතය සියයට 547 ක් විය. එහෙත් ආයෝජනවල වටිනාකම පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 26 කින් වර්ධනය වී තිබුණි. පෙර වර්ෂය තුළදී ජංගම ගිණුම්වල තිබූ අතිරික්ත ශේෂයන් කෙටි කාලීනව ආයෝජනය කර පොළී ආදායමක් උපයාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී එම ක්‍රියාමාර්ග අනුගමනයකර නොතිබීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි.

**(ii).** සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයේ මුළු වියදම් සියයට 22 කින් වර්ධනය වී තිබූ අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එහි ඇතුළත් ගමන් වියදම් රු.875,000 සිට රු. 1,763,000 දක්වා සියයට 101 කින් වර්ධනය වී තිබුණි.

**(iii).** ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී වැටුප් හා වේතන, ගමන් වියදම් හා යැපීම් දීමනා, සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, කොන්ත්‍රාත් සේවා, අනෙකුත් පුනරාවර්තන වියදම් සහ ශිෂ්‍යාධාර යන වියදම් විෂයයන්හි රු. 117,874,295 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර, ඒවායේ ප්‍රතිශතය සියයට 15 සිට සියයට 101 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

(ආ) මූල්‍ය තත්ත්වය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i). සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වත්කම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 132 කින් වර්ධනය වී තිබූ අතර, ප්‍රාග්ධන අත්තිකාරම් ශේෂය රුපියල් මිලියන 59 සිට රුපියල් මිලියන 173 දක්වා සියයට 193 කින් වර්ධනය වීම මීට බලපා තිබුණි.

(ii). ජංගම වගකීම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 98 කින් වර්ධනය වී තිබූ අතර, නොනිමි කාර්යයන් සඳහා වූ ප්‍රාග්ධන ප්‍රදාන සියයට 67 කින් වර්ධනය වීම මීට බෙහෙවින් බලපා තිබුණි.

(iii). සමුච්චිත අරමුදල දිගින් දිගටම හීන වෙමින් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් රුපියල් මිලියන 134 කින් හීන වී තිබුණි. එහි ප්‍රතිශතය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 19 ක් විය.

3.3 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

විශ්වවිද්‍යාලය සමඟ 2012 වර්ෂයේදී රු. 27,000,952 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත කුලියාපිටිය පරිශ්‍රයේ තනි පුද්ගල නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ, කොන්ත්‍රාත්තුව අතරමඟ නතර කර දැමූ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු විසින්, ඔහුගේ ඇපකරවල වටිනාකම වූ රු. 6,000,000 ක් අය කිරීම අත්හිටුවන ලෙසට 2014 මාර්තු 17 දින විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචන

4.1 කාර්යසාධනය

(අ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම, ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| | පීඨය | විස්තරය | පෙර වර්ෂය 2012 රු. | සමාලෝචිත වර්ෂය 2013 රු. | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස සියයට |
|---|---|---|---|---|---|
| (i) | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | වියදම | 49,046,407 | 73,543,884 | 50 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | 1042 | 1312 | 26 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | 47,069 | 56,055 | 19 |
| (ii) | ව්‍යවහාරික විද්‍යා පීඨය | වියදම | 59,621,296 | 74,208,889 | 24 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | 375 | 428 | 14 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | 158,990 | 173,385 | 09 |
| (iii) | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | වියදම | 65,611,393 | 84,163,292 | 28 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | 382 | 439 | 15 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | 171,758 | 191,716 | 12 |
| (iv) | පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨය | වියදම | 66,078,130 | 82,539,376 | 25 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | 314 | 393 | 25 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | 210,440 | 210,024 | - |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 වර්ෂය තුළ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය සහ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨවලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණු අතර, එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 34 ක් හා සියයට 30 ක් විය.

(ii) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සියයට 19 කින්ද, ව්‍යවහාරික විද්‍යා පීඨයේ සියයට 09 කින්ද, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සියයට 12 කින්ද පසුගිය වර්ෂයට සාපේක්ෂව ඒක ශිෂ්‍ය පිරිවැය වැඩි වී තිබුණි.

(ආ) විභාග පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම
--------------------------------------------

2013 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ පැවති පීඨ 4 මඟින් පවත්වා තිබුණ විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 397 ක්වූ අතර, ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලයේ පශු සම්පත්, ධීවර හා පෝෂණ විද්‍යා පීඨය මඟින් 2013 වර්ෂයේදී පවත්වන ලද විභාග සඳහා ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 13 කට ආසන්න කාලයක් ගතකර තිබුණු අතර, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය විසින් ඒ සඳහා මාස 8 කට ආසන්න කාලයක් ගතකර තිබුණි.

(ii) ව්‍යවහාරික විද්‍යාපීඨය හා කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය විසින් 2013 වර්ෂයේ පවත්වන ලද විභාගවලින් සියයට 11 කට ආසන්න ශිෂ්‍ය සංඛ්‍යාවක් විභාගවලින් අසමත්ව තිබුණු අතර, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය සහ පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය විසින් පවත්වන ලද විභාගවලින් සිසුන් අසමත්වීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 6 ක් හා සියයට 5 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පැවති අධ්‍යයන පීඨ 04 හි 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචිව සිටි 1037 ක්වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 122 ක් හෙවත් සියයට 12 කට ආසන්න ප්‍රමාණයක් වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරු වී ගොස් තිබුණු අතර, මාරුවීයාමට හේතුව ශිෂ්‍යයින් සඳහා වෙන්වී තිබුණු පහසුකම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ශිෂ්‍ය සංඛ්‍යාව හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සංඛ්‍යාව අතර පැවතිය යුතු සම්මත අනුපාතය 18:1 ක් වුවද, එහි තථ්‍ය අනුපාතය 37:1ක් විය. එසේම කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ එම සම්මත අනුපාතය 10:1 ක් විය යුතු වුවද, තථ්‍ය අනුපාතය 13:1 ක් විය. අනෙකුත් පීඨ දෙකෙහි සම්මත අනුපාතයට වඩා තථ්‍ය අනුපාතය සුළු ප්‍රමාණයකින් වැඩිවී තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිටි ආචාර්යවරුන් දෙදෙනෙකු විදේශගත වීමේදී, එකඟ වූ ගිවිසුම් කඩකිරීම හේතුවෙන් තවදුරටත් අයවිය යුතුව තිබූ රු. 1,542,625 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

(ආ) බාහිර දේශකවරුන් ඉටුකළ දේශන පිළිබඳ වාර්තා පොතෙහි සටහන් හා ඔවුන් වෙත ගෙවීම් කරන ලද වවුචර්වල දක්වා තිබූ සටහන් නොගැලපෙන අවස්ථා පැවතීම හා ශිෂ්‍ය අත්සන් ලේඛනවල අත්සන් තබා නොතිබීම සහ ශිෂ්‍ය අත්සන් ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම ආදී දුර්වලතා මඟහරවා ගැනීමට කළමනාකරණය කටයුතුකර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ ඡායා පිටපත් කිරීමේ යන්ත්‍ර සේවා කිරීම්වලට අදාල සේවා ගිවිසුම් සඳහා ගෙවීම් කිරීමේදී සේවාව සැපයීමට පෙර අදාල ආයතනවලට ගෙවීම් කළයුතු බැවින්, විශ්වවිද්‍යාලය අදාල ආයතන සමඟ ගිවිසුම් ගතවිය යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය සඳහා සේවා සැපයීම වෙනුවෙන් රු.821,571 ක් ගෙවීම් කර තිබුණද, ගිවිසුමට අනුව සේවාව සැපයීම සඳහා පැමිණ නොතිබූ අවස්ථා සම්බන්ධයෙන් බලධාරීන් කටයුතු කර නොතිබුණි.

(ඇ) Outrech Center අරමුදල යටතේ 2011 මැයි 06 දින මාකඳුර පරිශ්‍රයේ ගිණුම් අංශය විසින් ආරම්භ කර තිබූ රු. 250,000 බැගින් වූ රු. 1,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 04 ක කල් පිරෙන දිනයන් දක්වා නොතිබූ අතර, ස්ථාවර තැන්පත් පොළිය සියයට 5 ක් ලෙස සටහන් කර තිබුණි. ඉකුත් වර්ෂ කිහිපය තුළ බැංකු පොළී අනුපාතය ඉතා ඉහළ මට්ටමක පැවතියද විශ්වවිද්‍යාලය විසින් අදාල මුදල් ආයෝජනය කිරීමේදී එම තත්ත්වය සැලකිල්ලට ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඉ) ශිෂ්‍යයින් 60 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයීම සඳහා රු.2,700,000 ක වාර්ෂික කුළියකට ගොඩනැගිල්ලක් කුළියට ගැනීම හේතුවෙන් එහි ඒක ශිෂ්‍ය නේවාසික කුළී පිරිවැය රු.45,000 ක් වී තිබුණි. මෙම ගොඩනැගිල්ල මහල් දෙකකින් සමන්විත වී තිබුණු අතර, එක් මහලක ශිෂ්‍යයින් 75 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයිය හැකිව තිබියදීත් ශිෂ්‍යයින් 60 දෙනෙකු සඳහා මහල් දෙකක් කුළියට ගැනීම කළමනාකරණ අකාර්යක්ෂමතාවයක් බව නිරීක්ෂණය විය. තවද ඉකුත් වර්ෂයේදී මෙම මහල් දෙක වෙන වෙනම කුළියට ගෙන තිබුණු අතර, එක් මහලක් සඳහා ගෙවා තිබුණු මුදල රු.1,242,000 ක් විය.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ බාහිර කථිකාචාර්යවරුන් දෙදෙනෙකුහට ඉගැන්වීම සඳහා වෙන්කර දී තිබුණු පැය ගණන 330 ක් වුවද, ඉන් ආවරණය කර තිබුණේ පැය 210.5 ක් පමණි. පැය 119.5 ක් අඩුවෙන් ඉගැන්වීම හේතුවෙන් සිසුන්ට අදාල විෂයය කරුණු පිළිබඳව අවබෝධයක් ලබාදීම සඳහා සැලසුම් කර තිබුණු ඉලක්කයන් එසේද යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

කුලියාපිටිය පරිශ්‍රයේ එළිමහන් රංග පියය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු. 7,736,775 ක්වූ අතර, අදාල ප්‍රසම්පාදන කටයුතු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුනොකර, විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකිරීම සඳහා එම කාර්යය අදියර 03 ක් යටතේ වෙන් වෙන්ව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.

4.5 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

භාණ්ඩාගාර ලේකම්ගේ අංක.45 හා 2011 අප්‍රේල් 07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ යෝජිත පර්යේෂණ දීමනාව අචාර්යවරුන් විසින් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන මුළුමනින්ම උල්ලංඝණය කර තිබුණි. ඒ අනුව 2011 හා 2012 වර්ෂවලදී ජාතික පර්යේෂණ ආයතනයෙන් පිළිවෙලින් රු.5,000,000 ක් රු.4,630,522 ක් ලබාගත් විශ්වවිද්‍යාලයේ පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨයට අනුයුක්තව ඇති ආචාර්යවරයකු හා මහාචාර්යවරයෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් පිළිවෙලින් රු.176,504 ක් හා රු.191,672 ක් පරීක්ෂණ දීමනා ගෙවා තිබුණි.

4.6 හඳුනාගත් අලාභ
-------------------

විශ්වවිද්‍යාලය විසින් රු.1,656,000 ක් කුළී ගෙවීමේ පදනම මත ලබා ගෙන තිබුණු නිවාස 05 ක පදිංචිකරුවන්ගෙන් නිවාස කුළී වශයෙන් අයකර තිබුණේ කාර්ය මණ්ඩල නේවාසිකාගාර කමිටු තීරණ පරිදි රු.175,200 ක් පමණි. ඒ අනුව විශ්වවිද්‍යාලයට දැරීමට සිදුවී තිබූ අතිරේක පිරිවැය වර්ෂයකට රු.1,480,800 ක් වූ අතර අවම වශයෙන් ආර්ථික කුළිය අයකළේ නම් මෙම අලාභය අවම කරගත හැකිව තිබුණි.

4.7 ආර්ථික නොවූ ගනුදෙනු
----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුලියාපිටිය පරිශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ල බදු ගැනීමේදී එහි තක්සේරු වටිනාකම ඉක්මවා රු. 167,000 ක් ගෙවා තිබුණි.

(ආ) හැකිතාක් දුරට අවම පිරිවැයෙන් මෙයෙයුම් කටයුතු සිදුකිරීම කළමණාකරණයේ වගකීම වුවද කුළී පදනම මත ගොඩනැගිලි ලබාගැනීමේදී වර්ෂයකට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට ගන්නා ගොඩනැගිලි වෙනුවෙන් කුළිය වාර්ෂික කුළී තක්සේරු පදනම වෙනුවට මාසික කුළී පදනම මත ගැනීම නිසා විශ්වවිද්‍යාලයට අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

4.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාකඳුර පරිශ්‍රයේ අව්වාහක අධ්‍යයන කාර්ය මණ්ඩල නේවාසිකාගාරය ඉදිකිරීම
------------------------------------------------------------------------------------

(i). ඉහත කොන්ත්‍රාත්තුව 2012 අගෝස්තු මාසය වන විට අවසන් කළයුතු වුවත්, අවසන් වැඩ වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2013 මාර්තු මාසයේදීය. ඒ සඳහා වූ කල් දිගුව අනුමත කර තිබුණේ 2014 ජුනි 26 දිනදීය.

(ii). ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් සඳහා ගෙවීම් කිරීමේදී On Account Payment ලෙස යම් මුදලක් ගෙවිය හැකි වුවත්, කොන්ත්‍රාත්තුව සඳහා මිනුම් වාර්තා නොමැතිව 2013 දෙසැම්බර් 23 දින රු.1,911,073 ක් ගෙවා තිබුණි.

(iii). කොන්ත්‍රාත් ගිවිසුමට අනුව මිළ විචලනයන්ට අදාල ගෙවීම් කිරීම සඳහා වූ කොන්දේසි පැහැදිලිව ඇතුළත් කර නොතිබියදීත්, මිල විචලනයන් සඳහා රු. 1,785,119 ක් ගෙවා තිබුණි.

(ආ) කෙරීගෙන යන වැඩ
----------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ලෙස රු. 291,447,873 ක් වටිනා කාර්යයන් 26 ක් දක්වා තිබූ අතර, ඉන් රු. 3,270,150 ක් වටිනා කාර්යයන් 05 කට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට දක්වා තිබූ ශේෂයේ කිසිදු වෙනසක් සිදුනොවී සමාලෝචිත වර්ෂය තුළදීද පැවතීම හේතුවෙන් එම කාර්යයන්හි කිසිදු ප්‍රගතියක් සිදුවී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට වයඹ විශ්වවිද්‍යාලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කෙරේ.

(අ) විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 272 ක් වුවද, තථ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව 219 ක් විය. සමාලෝචිත වර්ෂයේදී සමහර අධ්‍යයන අංශවල ඇතැම් විෂයයන් සඳහා විශේෂ නිපුනතාවයක් ඇති ආචාර්යවරුන් නොමැති වීම හේතුවෙන් බාහිර දේශකයින් 44 දෙනෙකු බඳවා ගෙන ඔවුන්ට වැටුප් වශයෙන් රු. 2,928,925 ක් ගෙවා තිබුණි.

(ආ) අනුමත සේවක සංඛ්‍යාව අනුව සුළු සේවකයන් 26 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර, එය දෛනික කටයුතු කර ගෙන යාමට එතරම් බාධාවක් නොවූවද, විවිධ හේතු දක්වමින් බාහිර ශ්‍රම සේවා සපයන ආයතනයකින් කම්කරුවන් 15 දෙනෙකු බඳවා ගෙන ඔවුන්ගේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,765,596 ක් ගෙවා තිබුණි.

(ඇ) ලිපිකරු හා සමාන්තර සේවා වෙනුවෙන් අවිධිමත් ලෙස තාවකාලික ලිපිකරුවන් වශයෙන් 05 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් 2010 - 2015 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී වසර 2013 - 2017 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි නව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. නව සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී පෙර සංයුක්ත සැලැස්මට ඇතුළත්ව තිබූ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතුවලට සෘජු බලපෑමක් ඇති කරවන පහත සඳහන් ඉලක්ක හා කාර්යයන් අත්හැර දමා තිබුණි.

(ආ) වයඹ විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කර තිබූ 2013 - 2017 නව සංයුක්ත සැලැස්මට අනුව වයඹ විශ්වවිද්‍යාලයේ ස්වයං උත්පාදන මූල්‍ය ආයෝජන සියයට 15 සිට සියයට 25 දක්වා වාර්ෂිකව වර්ධනය කිරීම අපේක්ෂා කර තිබුණි. එහෙත් එම අරමුණ ඉටුකර ගැනීම සඳහා යෝජිතව තිබුණු කරුණු අතර ගාස්තු අයකර ගන්නා පාඨමාලා සඳහා දේශීය හා විදේශීය සිසුන් බඳවා ගැනීම හා කාර්ය මණ්ඩලයේ විශේෂඥ දැනුම බාහිර සමාජය වෙත ලබාදීම යන ක්‍රියාකාරකම් ඉටුවී නොතිබුණි. තවද ඒ සඳහා යෝජිතව තිබුණු රු. මිලියන 4 ක ප්‍රතිපාදනද සලසා දී නොතිබුණි.

**5.2** ක්‍රියාකාරී සැලැස්ම

(අ) විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් විධිමත්ව සකස් කර නොතිබුණු අතර, පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් කාර්තු පදනම මත වියදම් කරන ආකාරය පිළිබඳ විස්තරයක් පමණක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මට අනුව ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් යටතේ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 59,500,000 ක් වෙන් කර තිබූ අතර, එම ප්‍රතිපාදනය මඟින් ඉටුකිරීමට අපේක්ෂිත වැඩ විෂයයන් මොනවාද යන්න සැලසුම් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී විවිධ වැඩ විෂයයන් 52 ක් සඳහා රු. 31,816,149 ක් එනම් ඒ සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 64 ක් වැයකර තිබුණි.

(ii) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. 242,000,000 ක් වටිනා වැඩ විෂයයන් ඉටු කිරීමට අපේක්ෂා කළද, සමාලෝචිත වර්ෂය අවසානයට ඒවායේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොවූ බව නිරීක්ෂණය විය. ඒ අනුව මාකඳුර සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ලද ප්‍රතිපාදන වලින් සියයට 100 ක්ද, ව්‍යවහාරික විද්‍යා පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලද ප්‍රතිපාදනවලින් සියයට 71.16 ක්ද, මාකඳුර තනි පුද්ගල නේවාසිකාගාර ඉදිකිරීම සඳහා වූ ප්‍රතිපාදනවලින් සියයට 67.57 ක්ද යනාදී වශයෙන් වැඩ විෂයයන් 09 ක් සඳහා ලද ප්‍රතිපාදනවලින් රු. 16,807,559 ක් ඉතිරි කර තිබුණි. තවද ධීවර හා පශු පෝෂණ විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ පියවර II ඉදිකිරීම සඳහා ලද ප්‍රතිපාදන ඉක්මවා සියයට 328.77 ක් වැය කර තිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

වැය විෂයයන් 32 කට අදාලව අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබූ අතර, වැය විෂයයන් 27 කට අදාලව අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි. වැය විෂයයන් 04 ක මුළු ප්‍රතිපාදිත මුදලම වියදම් කර නොතිබුණි. එහෙයින් විශ්වවිද්‍යාලය විසින් වාර්ෂික අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක 02 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය අනුව අදාල වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, විශ්වවිද්‍යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

වයඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් වෙත 2010 - 2011 කාලසීමාව තුළ ඒකාබද්ධ අරමුදලින් එක් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කළ ආචාර්යවරයකු වෙත එම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 99,882 ක් ගෙවා තිබූ අතර, එම ව්‍යාපෘතියට අදාල පර්යේෂණ වාර්තාව 2013 පෙබරවාරි අවසානයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 ජුනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

5.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් පිරිනමන උපාධිය විශේෂ උපාධියක් නොවීම හේතුවෙන් වර්ෂ 2007 සිට මේ වන තෙක් මෙම පීඨයෙන් පළමු පෙළ පන්ති සාමාර්ථ සහිත සාමාන්‍ය උපාධියක් ලබා පිටවූ උපාධිධාරීන් 40 දෙනෙකුට එම පීඨයේ හෝ වෙනත් විශ්වවිද්‍යාල වලද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ රැකියා අවස්ථා අහිමි වී තිබුණි. ඒ සඳහා හේතු වී තිබුණේ වයඹ විශ්වවිද්‍යාලය විසින් එම පාඨමාලාව සඳහා විද්‍යාවේදී විශේෂ උපාධි

පාඨමාලාවක් ආරම්භ කර නොතිබීමයි. මේ හේතුව මත විශ්වවිද්‍යාලය විසින් එම පීඨයේ 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිට විශේෂ විද්‍යාවේදී උපාධි පාඨමාලා 03 ක් ආරම්භ කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්
----------------------

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය
(ආ) පුස්තකාල පොත් හා සඟරා මිලදී ගැනීම
(ඇ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
(ඈ) අත්තිකාරම් ලබාදීම
(ඉ) බාහිර පාඨමාලා පැවැත්වීම
(ඊ) තොග පාලනය
(උ) කාර්ය මණ්ඩල
(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය